සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# නාට්‍ය හා රංග කලාව

9 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

01 නාට්‍යයක තේමාව යනු

(1) නාට්‍ය ශෛලියයි. (2) නාට්‍ය පෙළින් ප්‍රකාශ වන අර්ථයයි.

(3) අනුකරණයයි. (4) සමාරෝපයයි.

02 නාට්‍යයක ඇතුලත් අනුෂාංගික අංගයකි

(1) නාට්‍ය සංගීතය (2) නාට්‍ය පෙළ (3) නාට්‍ය සංවාද (4) රංග විධාන

03 කැලණි පාලම නාට්‍ය සඳහා පසුතලයට යොදා ඇත්තේ,

(1) පාලම, පැල්පත් (2) පාලම, කීර කොටුව

(3) විදුලි පහන්, කැලණි ගඟ (4) වැල් පාලම, කීර කොටුව

04 ''සාත්වික අභිනය'' යන්නෙන් අදහස් වන්නේ,

(1) ක්‍රියාව මූලික කරගනිමින් කරනු ලබන චලනයන් ය.

(2) මනස මූලික කරගනිමින් කරනු ලබන චලනයන් ය.

(3) ශෛලිය පදනම් කරගනිමින් කරනු ලබන භාවයන් ය.

(4) ආංගික අභිනයට පමණක් අයිති චලනයන් ය.

05 වචන නිරවුල්ව, පැහැදිලිව ප්‍රකාශ කිරීම සඳහා සම්බන්ධ රංග අභ්‍යාස වන්නේ,

(1) ශිථිලකරණ අභ්‍යාස (2) මානසික අභ්‍යාස

(3) ස්වසන අභ්‍යාස (4) කටහඬ අභ්‍යාස

- අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 ලෝකධර්මී නාට්‍ය ශෛලියට අදාළ සංවාද එදිනෙදා ව්‍යවහාර භාෂාවට සමීප වේ. (   )

07 ''මට දවල් වෙනකම් බුදිය ගන්ඩ ඕනෑ'' යන සංවාදය කදාවළලු නාට්‍යයට අයත් වන්නකි. (   )

08 ''සකස්කඤ්' කියවීම තුළින් සාත්වික අභිනය ප්‍රබල කරගත හැකිය. (   )

09 නාට්‍ය ධර්මී සංවාදවල රිද්මයක් නැත. (   )

10 ''පරිකල්පනය'' යනු නිර්මාණය කළ දෙයක් ඒ ආකාරයෙන්ම කිරීමයි. (   )

- **ප්‍රශ්න අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| A | B |
|---|---|
| 1. ආලවක දමනය | දේවදූතයා |
| 2. මිලින්ද ප්‍රශ්නය | ගදුහයා |
| 3. දොරකඩ අස්න | මිළිඳු රජ |
| 4. යුගාසන බණ | භික්ෂූන් වහන්සේ |
| 5. සති පිරිත | දෙවිවරු |

11 ගදුහයාගේ චරිතය අන්තර්ගත වන්නේ,

(1) යුගාසන බණ (2) සති පිරිත (3) ආලවක දමනය (4) මිලින්ද ප්‍රශ්නය

12 සති පිරිතක් අවසානයේ සිදුකරනු ලබන බෞද්ධ පූජාකර්මය වන්නේ,

(1) යුගාසන බණ (2) ආලවක දමනය (3) මිලින්ද ප්‍රශ්නය (4) දොරවක අස්න

13 මෙම පූජාකර්මවලින් රජකෙනෙකුගේ චරිතයකට සමාරෝපය වී ඇත්තේ,

(1) මිලින්ද ප්‍රශ්නය (2) ආලවක දමනය (3) යුගාසන බණ (4) සති පිරිත

14 බෞද්ධ පූජාකර්ම වලින් වඩාත් නාට්‍යමය ලක්ෂණ ඇතුළත් පූජාකර්මය වන්නේ,

(1) සති පිරිත (2) මිලින්ද ප්‍රශ්නය (3) ආලවක දමනය (4) දොරකඩ අස්න

15 සති පිරිතක් අවසානයේ පිරිත් ඇසීමට ආරාධනා කරන්නේ,

(1) ගදුහයාට (2) දෙවිවරුන්ට (3) මිළිඳු රජුට (4) භික්ෂූන්ට

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**

|  |  |  |  |
|---|---|---|---|
| A | B | C | D |

16 ''තොප්පි වෙළෙන්දා නාට්‍ය'' නිර්මාණය කළ ශිල්පිණිය වන්නේ,

(1) A (2) D (3) C (4) B

17 සිංහබාහු නාට්‍යයේ භූමිකාවක් නිරූපණයට දායක වී ඇත්තේ,

(1) A (2) D (3) C (4) B

18 ඉහත ශිල්පීන් අතුරින් සිනමාව හා ටෙලිනාට්‍ය සඳහා රංගනයෙන් දායක වී ඇත්තේ,

(1) A B (2) A C (3) B C (4) A D

19 ගුණසේන ගලප්පත්ති මහතාගේ ''මුදු පුත්තු'' නාට්‍ය සඳහා රංගනයෙන් දායක වී ඇත්තේ,

(1) A C (2) A B (3) C D (4) B D

20 හස්තිකාන්ත මන්තරේ නාට්‍ය සඳහා රංගනයෙන් දායක වී ඇත්තේ,

(1) A (2) C (3) B (4) D

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.**

01



(i) ඉහත දැක්වෙන රූපයේ ඇති නාට්‍ය කුමක් ද? (ල. 02)

(ii) එහි ඇති චරිත දෙක නම්කර ඒ සඳහා රංගනයෙන් දායකවන රංගන ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(iii) ඉහත නාට්‍යයේ තේමාව සඳහා පාදක වූ ජාතක කතාව කුමක් ද? (ල. 02)

(iv) මේ නාට්‍ය තුළින් ප්‍රකට වන යහපත් හා අයහපත් මිනිස් චර්යා 2 ක් ලියන්න. (ල. 02)

(v) මෙම නාට්‍යයෙන් ඔබ සිත්ගත් ගැටුම් අවස්ථාවක් ලියා දක්වන්න. (ල. 02)

02 (i) ''අභිනය'' යන්න නිර්වචනය කරන්න. (ල. 02)

(ii) අභිනය පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථය සඳහන් කර එහි කතුවරයා නම් කරන්න. (ල. 03)

(iii) ඔබ කැමති අභින දෙකක් තෝරාගෙන නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

03 (i) නිවැරදි සංවාද භාවිතයට ප්‍රගුණ කළයුතු රංග අභ්‍යාසයක් නම් කරන්න. (ල. 02)

(ii) ඒ සඳහා සුදුසු ග්‍රන්ථ 2 ක් සඳහන් කරන්න. (ල. 03)

(iii) සිරුර ලිහිල් කිරීම සඳහා ඔබ පන්ති කාමරයේ උගත් රංග අභ්‍යාසයක් සිදුකරන ආකාරය ලියා දක්වන්න. (ල. 05)

04 (i) ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න. (ල. 02)

(ii) ලෝකධර්මී නාට්‍ය ශෛලියේ විශේෂ ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) කදාවළලු නාට්‍යයේ දැකිය හැකි නාට්‍යධර්මී ලක්ෂණ නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 05)

05 පහත දැක්වෙන පාඨය පාදක කරගනිමින් කෙටි නාට්‍යයකට සුදුසු පෙළක් රචනය කරන්න.

''පවතින නොසන්සුන්කාරී වාතාවරණය හමුවේ සිසුන් පරීක්ෂා කර පාසල තුළට ගැනීමට දෙමාපිය සහය ලබාගන්නට විය. දෙමාපියෙකුට තම බෑගය පරීක්ෂා කිරීමට දීමට අකමැති වූ කුමුදු විදුහල්පති තුමා වෙත යොමු කෙරිණි. විදුහල්පතිතුමා එම බෑගය පරීක්ෂා කිරීමේ දී........

(i) සංවාද හා රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ල. 03)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් පෙළ සකස් කිරීම. (ල. 03)

(iii) දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිතව නාටෝචිත අවස්ථා නිර්මාණයට (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 1 | (03) | 1 | (04) | 2 | (05) | 4 | (06) | ✓ | (07) | × | (08) | × |
| (09) | × | (10) | × | (11) | 3 | (12) | 4 | (13) | 1 | (14) | 3 | (15) | 2 | (16) | 3 |
| (17) | 2 | (18) | 1 | (19) | 2 | (20) | 3 | | | | | | | | |

## II - කොටස

01 (i) කදාවළලු

(ii) සිටු දියණිය - සුනේත්‍රා බුද්ධදාස / සේරිවාණිජ - එඩ්මන්ඩ් විජේසිංහ

(iii) සේරිවාණිජජාතක කතාව

(iv) කපටිකම / වෛර කිරීම / අවංකකම

(v) ශිෂ්‍යයා ලියා ඇති පිළිතුර බලා ලකුණු දෙන්න. (ලකුණු 2 x 5 = 10)

02 (i) අභි + නය - අභි යනු ඉදිරියට නය + යනු පැමිණවීමයි. ඒ අනුව ඉදිරියට පැමිණවීම (ල. 02)

(ii) නාට්‍ය ශාස්ත්‍රය, භරතමුණි (ල. 03)

(iii) අභින දෙකක් නම්කර ඒ පිළිබඳ පැහැදිලි කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 05)

03 (i) කටහඬ අභ්‍යාස (ල. 02)

(ii) බුද්ධ ගජ්ජය, සකස්කඩ (ල. 03)

(iii) ශිථිලකරණ අභ්‍යාසය කරන ආකාරය ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 05)

04 (i) * ලෝකධර්මී නාට්‍ය ශෛලිය / නාට්‍යධර්මී නාට්‍ය ශෛලිය (ල. 02)

(ii) * ලෝකධර්මී නාට්‍ය ශෛලියේ සංවාද එදිනෙදා ව්‍යවහාර භාෂාවට සමීපයි.
* චලන විධි, හැසිරීම් ආදිය ස්වභාවිකයි.
* වෙස්මුහුණු භාවිත නොකරයි. (ල. 03)

(iii) කදාවළලු නාට්‍යයේ ඇතුළත් නාට්‍යධර්මී ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 05)

05 (i) සංවාද හා රංග විධාන සහිත පෙළ නිර්මාණය (ල. 03)

(ii) චරිත අතර ගැටුම ඇතිවන ලෙස පෙළ සකස් කිරීම (ල. 03)

(iii) දෙගිඩියාව, කුතුහලය හා උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ල. 04)

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**දෙවන වාර පරීක්ෂණය 2019**

**9 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව** **ප්‍රායෝගික පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 01 | ඔබ කැමති නාට්‍ය ගීතයක් ගායනය සමග නිරූපණය කරන්න. | (ලකුණු 10) |
| 02 | ලෝකධර්මී නාට්‍ය සංවාදයක් ඉදිරිපත් කරන්න. | (ලකුණු 05) |
| 03 | නාට්‍යධර්මී සංවාදයක් ඉදිරිපත් කරන්න. | (ලකුණු 05) |
| 04 | කතාන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. | (ලකුණු 10) |
| 05 | නිර්දේශිත කෘතියෙන් ඔබ කැමති චරිතයක් නිරූපණය කරන්න.<br>(සිටුදුව / මිත්තණිය / කච්චපුට / සේරිවාණිජ) | (ලකුණු 10) |